**ශීර්ෂය 230 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 08 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 12 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.5 ඡේදය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ශේෂය, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය සහ වසර අවසානයේ අග්‍රිම ශේෂයේ එකතුවට සමාන විය යුතු වුව ද, ඒසීඒ - 3 හි දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව රු.6,020 ක් වූ අග්‍රිම ශේෂය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා නොතිබූ අතර එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මාර්ගස්ථ මුදල් ලෙස මූල්‍ය වත්කම් යටතේ ද, අග්‍රිම ශේෂය ලෙස ජංගම වගකීම් යටතේ දක්වා නොතිබුණි. | | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වේ. |
| (ආ) රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 06 ඡේදය ප්‍රකාරව හඳුන්වා දී ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආකෘතිය අනුව වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් යටතේ දැක්විය යුතු රු. 543,683 ක පොලී ආදායම හා හැකියා වර්ධනය සඳහා දරන ලද රු.632,890 ක වියදම මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ දැක්විය යුතු වුවත් එම ආදායම හා වියදම ආයෝජන ක්‍රියාකරම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ දැක්වීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.89,207 ක් අඩුවෙන් දක්වා තිබුණ අතර ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ සිට ආපදා ණය පොලී ආදායම "මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය" යටතේ සටහන් කිරීමට කටයුතු කරනු ලබන බවත්, "හැකියා වර්ධනය" සඳහා දරන ලද රු.632,890 ක වියදම "2401 - කාර්ය මණ්ඩල පුහුණු" මූලධන වැය විෂයය යටතේ දරන ලද වියදමක්වන බැවින් පුනරාවර්තන වියදම් යටතේ සටහන් කිරීම නිවැරදි නොවන බවත් කාර්ය මණ්ඩල පුහුණුව ආයෝජන ක්‍රියාකාරකමක් බැවින් හැකියා වර්ධනය සඳහා දරණ ලද වියදම ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ "භෞතික වත්කම් ඉදිකිරීම් හා මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්" යටතේ දක්වා තිබීම නිවැරදි බව දන්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදි වර්ගීකරණය යටතේ දත්ත ඇතුළත් කළ යුතු වේ. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

**දේපල, පිරියත හා උපකරණ**

දේපල, පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2021 දෙසැම්බර් 31 දිනට වාහන වටිනාකම රු. 59,975,000 ක් වුව ද, එය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.53,700,000 ක් ලෙස ඉදිරියට ගෙනවිත් තිබුණි. වර්ෂය තුළ රු.6,275,000 ක වාහන අපහරණය කර තිබුණ ද, එය ඒසීඒ 6 ආකෘතියට ඇතුළත් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. එනම් මූල්‍ය ප්‍රකාශන සමඟ අමුණා ඇති ඒසීඒ 6 ආකෘති පත්‍රයෙහි තොරතුරු පෙන්නුම් කර තිබෙන ආකාරයෙහි (Display) දෝෂයක් පවතී. එහෙත් දෙපාර්තමේන්තුවේ CIGAS වැඩසටහනට, අදාළ වර්ෂය තුළ අපහරණය කරන ලද මෝටර් රථයේ වටිනාකම රු.6,275,000 ක් වන බව දන්වා තිබුණි. | ඒසීඒ 6 ආකෘතියේ ආරම්භක ශේෂ නිවැරදිව සටහන් කිරීමට කළ යුතු වේ. |
| (ii) | 2021 දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර හා උපකරණ වටිනාකම රු. 43,049,723 ක් වුව ද, එය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.40,863,680 ක් ලෙස ඉදිරියට ගෙනවිත් තිබුණි. වර්ෂය තුළ රු.2,186,043 ක යන්ත්‍ර හා උපකරණ අපහරණය කර තිබුණ ද, එය ඒසීඒ 6 ආකෘතියට ඇතුළත් කර නොතිබුණි. | වර්ෂය තුළ අපහරණය කරන ලද මුළු යන්ත්‍ර සූත්‍ර වටිනාකම රු.2,186,042 ක් වන බව දන්වා තිබුණි. | ආරම්භක ශේෂ වටිනාකම හා අපහරණ වටිනාකම ඒසීඒ 6 ආකෘතියේ නිවැරදිව සටහන් කළ යුතු වේ. |
| (iii) | වර්ෂය තුළ රු. 53,000 කට මිලදී ගත් යන්ත්‍ර හා උපකරණ වටිනාකම ඒසීඒ 6 ආකෘතියේ මිලදී ගැනීම් යටතට ඇතුළත් කර නොතිබුණි. | වර්ෂය තුළ යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම් රු.53,000 ක් වශයෙන් නිවැරදිව ඇතුළත් කර ඇති බව දන්වා තිබුණි. | මිලදී ගත් වටිනාකම ඒසීඒ 6 ආකෘතියේ ද, සටහන් කළ යුතු වේ. |
| (iv) | ඉහත (i), (ii), (iii) හි වෙනස්කම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 427 (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | තව ද ඒසීඒ 6 ආකෘති පත්‍රයෙහි 2022 දෙසැම්බර් 31 දිනට මෙම දෙපාර්තමේන්තුවේ වත්කම් ගිණුමේ අවසාන ශේෂයන් නිවැරදිව සටහන් වී ඇති බැවින්, මූල්‍ය ප්‍රකාශන වලට හෝ වත්කම් ගිණුමට කිසිදු බලපෑමක් සිදු වී නොමැති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | එක් මූලධන වැය විෂයයක් සඳහා වූ රු.50,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරණ ජාතික අයවැය චක්‍රලේඛය අනුව කටයුතු කිරීමට සිදුවීම නිසා අදාළ පුනරාවර්තන සහ මූලධන වැය විෂයයන්ගේ ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දන්වා තිබුණි. | නිසි අධ්‍යනයකින් යුතුව වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 02 ක් හා මූලධන වැය විෂයයන් 02 ක් සඳහා ප්‍රතිපාදන රු.3,140,000 කින් රු.1,030,071ක් ඉතිරිවී තිබූ අතර, එම ඉතිරිවීම් සියයට 25 සිට සියයට 47 දක්වා පරාසයක් ගෙන තිබුණි. | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරණ ජාතික අයවැය චක්‍රලේඛය අනුව කටයුතු කිරීමට සිදුවීම නිසා අදාළ පුනරාවර්තන සහ මූලධන වැය විෂයයන්ගේ ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දන්වා තිබුණි. | නිසි අධ්‍යනයකින් යුතුව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |
| (ඇ) | 2022 අප්‍රේල් 26 දිනැති 03/2022 අංක දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3 (xvii) ඡේදය ප්‍රකාරව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇත්නම් ඒවා වර්ෂය අවසන් වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගත යුතු වුවත්, වැය විෂයයන් 04 ක රු.2,927,000 ක් වූ ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මගින් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. | දෙපාර්තමේන්තුවේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා දැරිය යුතු අත්‍යාවශ්‍ය වියදම් දැරීම සඳහා 2022 අප්‍රේල් 26 දිනැති 03/2022 චක්‍රලේඛය බාධාවක් නොවේ. එබැවින් එකී අත්‍යාවශ්‍ය වියදම් දැරීම සඳහා, නිසි බලධරයාගේ එනම් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන මු.රෙ. 66 යටතේ වැය විෂයයන් 04 ක් මඟින් රු.2,927,000 ක ප්‍රතිපාදන අවශ්‍ය වැය විෂයයන් සඳහා මාරුකර ගැනීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රතිපාදන උපයෝජනය කළ යුතු වේ. |

### 2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මේ දක්වා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සම්බන්ධ කටයුතු හා ආයතනික කටයුතු මුදල් රෙගුලාසි සහ ආයතන සංග්‍රහය අනුව සිදුකර ඇත. විගණන විමසුමේ දක්වා ඇති ආකාරයේ සමාලෝචනයක් මීට පෙර වර්ෂ වලදී ද මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදුකර නොමැති අතර එවැනි සමාලෝචනයක් සිදු කරන ආකාරය පිළිබඳව නිසි අවබෝධයක් අප වෙත නොමැති බව දන්වා සිටීමට කැමැත්තෙමි. එබැවින් එවැනි සමාලෝචනයක් කිරීම පිළිබඳව ඔබගේ උපදෙස් ලබා දෙන්නේ නම් ඒ අනුව කටයුතු කිරීමට වග බලාගන්නා බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.2 (අ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | 2022 වර්ෂයේ රටතුළ පැවති ඉන්ධන අර්බුධය නිසා කාර්ය මණ්ඩලය සේවයට කැඳවීම සීමා කළ බැවින්, 2021 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු අදාළ නිලධාරීන්ගෙන් ලබා ගැනීමේදී සිදුවූ ප්‍රමාදය නිසා 2021 වර්ෂයට අදාළ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 1645 (අ) | • මාසික ගමන් සාරාංශය මාසිකව ලොග් සටහන් පොත්වල ඇතුළත් කළ යුතු වුවත් වාහන 09 කට අදාළව එසේ කර නොතිබුණි. | වාහන 06 ක් මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා අනුයුක්ත කර ඇත. එම වාහන වල මාසික ගමන් සාරාංශ, මාසිකව ඉදිරිපත් කරන ලෙස නිලධාරීන් වෙත දැනුම් දී ඇත. මෙම අනුයුක්ත කර ඇති නිල රථ වල මාසික ගමන් සාරාංශ ලොග් සටහන් පොත් වල මුල සිටම ඇතුළත් කිරීමක් සිදුකර නොමැති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| | | • වාහන 02 කට අදාළව අලුත්වැඩියා කිරීම් ලොග් පොත්වල ඇතුළත් කර නොතිබුණි.<br>• වාහන අනතුරු දෙකක් පිළිබඳව ලොග් පොත්වල සටහන් කර නොතිබුණි. | KM 0908 සංචිත රථයේ තොරතුරු 2022 නොවැම්බර් දක්වා ඇතුළත් කර ඇති අතර, 2022 දෙසැම්බර් මස ගමන් සාරාංශ විගණනය සඳහා යොමු කළ යුතුව ඇත්තේ 2023 ජනවාරි 15 දිනට පෙරය. එය සටහන් කිරීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි.KM 0890 රථය | |

| | | | | |
|---|---|---|---|---|
| | | | අළුත්වැඩියා තත්වයේ ඇත.<br>පිලිතුරු සපයා නැත.<br>KM 0908 හා KM 0896 යන වාහන වල සිදු වූ අනතුරු අතපසු වීමකින් ලොග් පොතෙහි ඇතුළත් කර නොමැත. ඉදිරියේ දී ඒ සම්බන්ධයෙන් නිවැරදිව ක්‍රියා කිරීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | |
| (ii) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2016 දෙසැම්බර් 31 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ හි 3.1 ඡේදය | වාහන 10 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | 2020,2021 වර්ෂවල අඛණ්ඩව කාර්යාල කටයුතු සිදු නොවීම හා 2022 වර්ෂය තුළ රට තුළ පැවති ආර්ථිකමය අර්බුදකාරි තත්වය තුළ ඉන්ධන ලබාදීම සඳහා පැනවුණු සීමාවන් හේතුවෙන් ඉන්ධන පරීක්ෂාවන් සිදු කිරීමට නොහැකි තත්ත්වයක් පැවතුණු බව දන්වා තිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම පරීක්ෂා කළ යුතු වේ. |
| | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛයේ 01 ඡේදය | දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම 2018 වර්ෂයේ පටන් සිදුකළ යුතු වුවත්, මෙ දක්වා කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. ඉදිරියේදී චක්‍රලේඛ අනුව කටයුතු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය සාධන ගිවිසුම් අත්සන් කළ යුතු වේ. |
| (iii) | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන මාර්ගෝපදේශයේ | තැන්පත් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2023 පෙබරවාරි 28 දිනට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතු | 2022 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමෙහි කිසිදු ශේෂයක් නොපැවතිණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව නියමිත දිනට තැන්පතු |

| | | | |
|---|---|---|---|
| 8.3 ඡේදය | වුවත්, 2023 මැයි 23 දින ඉදිරිපත් කර තිබුණි. | එසේ වුව ද, රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 2020/03 අනුව සකස්කළ "හිස් වාර්තාව" 2023 මැයි 16 දින රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව දන්වා තිබුණි. | සඳහා සැසඳීම් ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 03 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්රියාකාරී සැලැස්ම සකස්කර ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත 2022 ජනවාරි 13 දින ඉදිරිපත් කර තිබුණි. | විගණන විමසුමේ දක්වා ඇති කරුණු සමඟ එකඟ වෙමි. ඉදිරියේදී නියමිත දිනට ඉදිරිපත් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දුන් බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඉදිරිපත් කළ යුතු වේ. |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ඉහත චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර පාර්ලිමේන්තුවේ | 2022 වර්ෂයේ කාර්ය මණ්ඩලය සේවයට කැඳවීම සීමා කළ බැවින් 2021 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව සැකසීමට අවශ්‍ය තොරතුරු අදාළ නිලධාරීන්ගෙන් ලබා ගැනීමේදී සිදු වූ | චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවට |

| | | | |
|---|---|---|---|
| | සභාගත කිරීමට ඉදිරිපත් කළ යුතු වුවත්, 2021 වර්ෂයට අදාළ වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2022 අගෝස්තු 10 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණු අතර චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කළ යුතු වුවත්, විගණනය වෙත ඉදිරිපත් කළ කාර්ය සාධන වාර්තාව ඒ අනුව පිළියෙල කර නොතිබුණි. | ප්‍රමාදය නිසා වාර්ෂික කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ බවත්, වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ 14 ට අනුකූලව සකස්කර ඇත. එහි යම් සදොස් තැනක් වේ නම් එය පෙන්වා දෙන මෙන් දන්වා තිබුණි. | නියමිත දිනට ඉදිරිපත් කළ යුතු අතර මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් සියලු කරුණු ඇතුළත් කර වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කළ යුතු වේ. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට නීති කෙටුම්පත් කිරිම අවසන් නොවූ ඉල්ලීම් 100 ක ප්‍රමාණයක් ඉතිරි වී පැවතුණි. | 2022.12.31 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් 100 කි. මේවා 2022.12.31 දින හෝ ඊට ආසන්න දිනක ලැබුණු ඉල්ලීම් හෝ මෙම දෙපාර්තමේන්තුව විසින් මූලික හෝ සංශෝධිත කෙටුම්පත් යවනු ලැබ නීතිපති හෝ එම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හෝ ආයතනවල උපදෙස් හෝ නිරීක්ෂණ හෝ අවශ්‍ය කැබිනට් අනුමතය 2022.12.31 දින හෝ ඊට ආසන්න දිනක ලැබී ඇති හෝ තවමත් සාකච්ඡා මට්ටමේ පවතින බැවින් මෙම දෙපාර්තමේන්තුව විසින් අවසන් කිරීමට නොහැකි හෝ ඒවා වන බව දන්වා තිබුණි. | දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

### 3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) වගන්තිය ප්‍රකාරව ඊළඟ එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එසේ පිළියෙල කර නොතිබුණි. | 2022 වසරේදී සංශෝධිත අයවැය ලේඛනය මඟින් මිලදී ගැනීම සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනය රු.100,000 ක් පමණක් වූ අතර එම මුදල ද වියදම් කිරීමට අවසරය ලැබුවේ 2022 ඔක්තෝබර් මාසයේ සිට ය. එසේම 2022 වසරේ දී මිලදී ගැනීමේ අවශ්‍යතාවය පැවතියේ ද Voice Recorder දෙකක් පමණි. ඒ අනුව 2022 වසරේ දී ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරීමට පියවරගෙන ඇති බව දන්වා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 40 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ නොවෙමි. මෙම දෙපාර්තමේන්තුවේ “අභ්‍යන්තර විගණක” ලෙස කටයුතු කරනු ලබන්නේද අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ “ප්‍රධාන අභ්‍යන්තර විගණක” වන අතර එකී ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් 2022 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර ඇත. ඒ අනුව ජාතික විගණන පනතේ සඳහන් අභ්‍යන්තර විගණන අවශ්‍යතාවය ඉටුකර ඇති බව දන්වා තිබුණි. | ජාතික විගණන පනත හා මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 149 ක් වුව ද, තථ්‍ය කාර්ය මණ්ඩලය 93 ක් වූයෙන් නිලධාරීන් 56 ක සේවක පුරප්පාඩුව පැවතුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. තනතුරුවල පුරප්පාඩු පිරවීමට ක්‍රියාමාර්ගගෙන ඇති බව දන්වා තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | නීති කෙටුම්පත් සම්පාදනය අරමුණු කරගත් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සඳහා සෘජුව දායකත්වය ලබා දෙනු ලබන ජ්‍යෙෂ්ඨ හා තෘතීයික මට්ටමේ තනතුරු 11 න් තනතුරු 04 ක් සඳහා පුරප්පාඩු 31 ක් පවතින නමුත්, මේ සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම පුරප්පාඩු සංඛ්‍යාව අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 49 කි. | මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සඳහා සෘජුව දායක වන නිලධරයන්ගේ තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීමට ක්‍රියාමාර්ගගෙන ඇති බව දන්වා තිබුණි. | කඩිනමින් පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |